# පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ස්වකීයව දායකවීමට පවතින හැකියාව, හිපි ජනතාවගේ ජීවන පැවැත්ම ආශ්‍රයෙන් කෙරෙන දාර්ශනික අධ්‍යයනයක්

*කේ.ඒ.ඩී.එස්. ජයරත්න [1]*

1960-1970 දශකයේ ඇමෙරිකා එක්සත් ජනපදය තුළ ධනවාදයත් සමග ආරම්භ වූ ඉතා ජනප්‍රිය ප්‍රති සංස්කෘතියක් වන්නේ හිපි සංස්කෘතිය යි. මෙම හිපි සංස්කෘතික වැසියන් ඔවුන්ටම ආවේණික වූ ජීවන රටාවක් ගොඩනගාගෙන තිබුණි. මොවුන් අවිහිංසාව, ආදරය සහ ස්වභාවධර්මය වෙනුවෙන් පෙනීසිටි බව සඳහන් වේ. ස්වභාවධර්මය රැක ගැනීමේ අවශ්‍යතාව වචනයෙන් නොව ක්‍රියාවෙන් ලෝකයට පෙන්නුම් කිරීමට උත්සහ කරන ලද තරුණ ප්‍රජාවක් ලෙස මෙම හිපි ජනතාව හඳුන්වාදීම නිවැරදි ය. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ පරිසර දූෂණය අවම කර ගැනීම කෙරෙහි හිපි ජනතාවගේ ජීවන රටාව ආශ්‍රයෙන් ලැබෙන දායකත්වය කොතෙක් දුරට පරිසරය රැක ගැනීම සඳහා වර්තමානයේ දී උපයෝගීවනවා ද යන්න සම්බන්ධව සොයාබැලීම යි. හිපි ප්‍රජාවගේ ජීවන රටාව පරිසරය ආරක්ෂා කර ගැනීම කෙරෙහි අදාළ වන්නේ කෙසේද යන්න සම්බන්ධව අවබෝධ කර දෙමින් ඒ ඇසුරෙන් පරිසරය රැක ගැනීම කෙරෙහි දායක වීමට හැකි ආකාරය සාකච්ඡා කිරීම පර්යේෂණයේ අරමුණ වේ. පර්යේෂණයේ වැදගත්කම වන්නේ වර්තමානය තුළ සිදුවන පරිසර දූෂණය, දේශගුණික විපර්යාස, සම්පත් ක්ෂය වීම වැනි දැවෙන පාරිසරික ගැටලු විසඳා ගැනීම සඳහා හිපි ජනතාවගේ ජීවන ශෛලියේ අන්තර්ගත කාරණා ප්‍රායෝගික ජීවිතය කෙරෙහි යොදා ගනු ලබන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමයි. එහිදී ද්වීතියික දත්ත මූලාශ්‍ර ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදු කිරීමට අපේක්ෂා කෙරේ. හිපි ජනතාව පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ගන්නා ලද පළමු උපායමාර්ගය වන්නේ භාණ්ඩ පරිභෝජනය අවම කිරීම යි. එමෙන්ම කාබනික පොහොර භාවිතයෙන් ආහාර නිශ්පාදනය කර ගැනීම, පොලිතින් භාවිතය සම්පූර්ණයෙන්ම අත්හැර දැමීම, ස්වභාවික සම්පත් භාවිතයෙන් භාණ්ඩ නිශ්පාදනය කර ගැනීම සහ ව්‍යාපාර ආරම්භ කිරීම, ප්‍රවාහන පහසුකම් ආදිය පුද්ගලික භාවිතයෙන් අතහැර පොදු භාවිතය කරා යොමුවීම පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා හිපි ජනතාව විසින් ගෙනගිය ජීවන රටාව තුළ කැපීපෙනෙන ලක්ෂණ වේ. මානව අවශ්‍යතා ඉටුකර ගැනීමේදී ඒ තුළින් පරිසරයට සිදුවන හානිය අවම කරගැනීම හිපි ජනතාවගේ ජීවන රටාවේ ප්‍රධානම ඉලක්කය වේ. 1970 කාලයේ දී පරිසරය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ලෝක මිහිකත දිනය අප්‍රේල් 22 වන දින ලොවපුරා සැමරීම ආරම්භ කරනු ලබන්නේ ද මෙම හිපි සංස්කෘතික ජීවන රටාව ආශ්‍රයෙන් සිදුවන ලද බලපෑම් නිසාවෙනි. මේ අනුව පැහැදිලි වන්නේ හිපි ජනතාවගේ ජීවන රටාව පදනම් කොට ගෙන වර්තමානයේ ගෝලීය අර්බුදයක් බවට පත්ව ඇති පරිසර දූෂණය අවම කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික පියවර සකසා ගැනීමට මේ මගින් සැලකිය යුතු දායකත්වයක් සපයන බවයි.

***ප්‍රමුඛ පදඃ*** පරිසර දූෂණය, හිපි සංස්කෘතිය, ධනවාදය, අවිහිංසාව, භාණ්ඩ පාරිභෝජනය

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය. supunsarajayarathna164@gmail.com